**සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව - 2012/2018**

---------------------------------------------------------------------------------------------

සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවේ 2018 මාර්තු 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ සිට 2018 මාර්තු 31දිනෙන් අවසන් වර්ෂයන්ට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

--------------------

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ සිට 2018 මාර්තු 31දිනෙන් අවසන් වර්ෂ 6 කට අදාල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 2011 මාර්තු 31 දිනට පැවති වත්කම් හා වගකීම්වල තත්ත්වය**

---------------------------------------------------------------------------

සංස්ථාව විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2011 මාර්තු 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **වත්කම්** | **වටිනාකම**<br>**රු.** |
|---|---|
| ජංගම නොවන වත්කම් | 91,269,967 |
| ජංගම වත්කම් | 832,852,873 |
| **මුළු වත්කම්** | **924,122,840** |
| **බැරකම්** | |
| ජංගම බැරකම් | 45,828,677 |
| ජංගම නොවන බැරකම් | 929,570,102 |
| **මුළු බැරකම්** | **975,398,779** |
| ශුද්ධ වත්කම් / අයිතිය | (51,275,939) |

| | |
|---|---|
| **මුළු හිමිකම් හා බැරකම්** | **924,122,840** |
| මුළු ආදායම | 75,166,023 |
| මුළු වියදම | 77,894,846 |
| **ඌනතාවය** | **(2,728,823)** |

**2.2.1 වෙනත් කරුණු**

2003/2004 ගිණුම් වර්ෂයේ සිට 2010/2011 ගිණුම් වර්ෂය දක්වා වසර 08 ක ගිණුම් පෞද්ගලික විගණන සමාගම් විසින් විගණනය කර විගණනය සඳහා සාක්ෂි නොවීම මත විගණන මතයන් ව්‍යාවනය කර තිබුණි.

**2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 ජූලි 01 දිනැති අංක පීර්/ජීඕසීඕ/ටීආර් 9 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කළ ලිපිය අනුව සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන අපනයන සංස්ථාවට නිසි බලධාරියකු වසරක කාල සීමාවක් සඳහා පත්කර තිබුණ ද ඔහු 2018 වර්ෂය දක්වා පත්වීම දීර්ඝ කර නොගෙන නිසි බලධාරියා ලෙස කටයුතුකර තිබුණි. තවද, නිසි බලධාරියා විසින් ඉටු කලයුතු කාර්යයන් පිළිබඳව ලිඛිතව රාජකාරි පැවරුමක් කර නොතිබුණි.

(ආ) 2011 මාර්තු 31 දිනට දිගුකාලීන ආයෝජන යටතේ රු. මිලියන 52 ක් සීමාසහිත ලංකා නිෂ්පාදන අපනයන සංස්ථාවේ ආයෝජනය කර තිබූ අතර එහි වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු නොතිබුණි.

(ඇ) 2011 මාර්තු 31 දිනට ආශ්‍රිත පාර්ශවයන්ගෙන් ලැබියයුතු එකතුව රු 764,957,506 ක් හා එකතුව රු. 56,133,035 ක්වූ වෙළඳ හා අනෙකුත් ලැබියයුතු ශේෂ සම්බන්ධයෙන් ලෙජර්, ශේෂ පිළිබඳ උපලේඛණ , කාලවිශ්ලේෂණ හා 2018 මාර්තු 31 දිනට එම ශේෂවලින් අයවියයුතු ශේෂ පිළිබඳ උපලේඛණ , කාලවිශ්ලේෂණ ඉදිරිපත්කර නොතිබුණි.

(ඈ) 2011 මාර්තු 31 දිනට පිරිවැය රු. 17,357,133 ක් වූ වාහන හා රු. 23,530,433 ක් වූ යන්ත්‍ර තක්සේරුකර ආයෝජකයෙකුට විකුණා තිබුණද තක්සේරු වාර්තා , මුදල් ලද බවට තහවුරු වාර්තා විගණනය වෙත නොලැබුණි.

(ඉ) 2011 මාර්තු 31 දිනට වූ රු . 1,283,471 ක මුදල් ශේෂය , රු. 3,037,306 ක ස්ථාවර තැන්පතු මුදල හා වාහන, යන්ත්‍ර විකුණා ලද මුදල් වියදම් වූ ආකාරය දැක්වෙන තහවුරු වාර්තා විගණනය වෙත නොලැබුණි.

(ඊ) ඉඩම් ඇපයට තබා මූල්‍ය ආයතනවලින් ලබාගෙන තිබූ රු. 901,610,000 ක දිගුකාලීන ණය , රු. 17,185,562 ක බැංකු අයිරා හා එම ශේෂයන්හි වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු විගණනය වෙත නොලැබුණි.

(උ) 2011 මාර්තු 31 දිනට වෙළඳ හා අනෙකුත් ගෙවියයුතු ශේෂය රු. 10,768,203 ක් ද ස්ථාවර වත්කම් ඉවත්කිරීම මත හඳුනානොගත් රු.17,874,912 ක ශේෂයන් තහවුරු කර ගැනීමට විස්තර හා 2018 මාර්තු 31 දිනට ශේෂ පිළිබඳ තොරතුරු විගණනය වෙත නොලැබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

2010 අප්‍රේල් 30 දිනැති අංක 1651/20 දරණ ගැසට් පත්‍රයෙන් සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්කර තිබියදී සංස්ථාව සතු කර්මාන්තශාලා 06 න් කර්මාන්තශාලා 04 ක් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව මගින් පෞද්ගලික අංශය වෙත බදු පදනම මත ලබා දී තිබුණු අතර සිල්වඩෙල් කර්මාන්තශාලාව ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව වෙත පැවරූ බව සඳහන් වුවද ඒ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම ඇල්පිටිය කර්මාන්ත ශාලාව වසර 10 ක පමණ සිට නිශ්කාර්යව පැවතුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාවනැල්ල කේන්ද්‍ර අපසාරි කර්මාන්ත ශාලාව මාසික බදු කුලිය රු.439,898 කට 2012 මාර්තු 14 සිට 2042 මාර්තු 14 දක්වා වසර 30 කට ද මාවනැල්ල ටයර් ටියුබ් කර්මාන්ත ශාලාව මාසික බදු කුලිය රු.123,333 කට 2012 මාර්තු14 සිට 2042 මාර්තු 14 දක්වා වසර 30 කට ද බදුරලිය ක්‍රේප් රබර් කර්මාන්ත ශාලාව මාසික බදු කුලිය රු.39,500 කට 2012 මාර්තු 14 සිට 2042 මාර්තු 13 දක්වා වසර 30 කට ද බදු දී තිබුණි. එසේම වහරක ක්‍රේප් රබර් කර්මාන්ත ශාලාව 2011පෙබරවාරි 01 සිට 2016 ජනවාරි 31 දක්වා වසර 15 ක් සඳහා රු.28,125 ක මාසික බදු කුලියකටද 2016 පෙබරවාරි 01 සිට 2021 ජනවාරි 31 දක්වා රු.42.187 කට හා 2021 පෙබරවාරි 01 සිට 2026 ජනවාරි 31 දක්වා රු.63,281 කට වශයෙන් උපබදු දී තිබුණි. මේ අනුව 2012 වර්ෂයේ සිට 2016 දක්වා කර්මාන්තශාලා 03 කින් අයවූ බදුකුලීය ගිවිසුම පරිදි රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව විසින් අයකර ගෙන තිබුණු බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර එම කර්මාන්තශාලා තුනෙන් 2017 වර්ෂය සඳහා රු.1,003,130 ක මුදලක් අයකර ගැනීමට පවතින බව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MCED/IA-03/AQAG/SRMC හා 2017 ඔක්තෝබර් 24 දිනැති ලිපිය අනුව දක්වා තිබුණි.

(ආ) 2010 ජුනි 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර සමාලෝචන කමිටුවේ අධීක්ෂණය යටතේ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ තාක්ෂණික මඟපෙන්වීම් මත පෞද්ගලික අංශයේ ආයෝජකයන් වෙතින් අභිප්‍රාය ප්‍රකාශන කැඳවා සුදුසු ආයෝජකයෙක් තෝරාගැනීමට අනුමැතිය දී තිබූ අතර ඒ අනුව 2011 මාර්තු 05 දින පුවත්පත් දැන්වීම පළකර තිබුණි. එසේ වුවද අභිප්‍රාය ප්‍රකාශන කැඳවා සුදුසු ආයෝජකයෙක් තෝරාගැනීමට පෙර 2011 පෙබරවාරි 14 දිනවන විටත් අක්කර 06 පර්චස් 07 ක ඉඩම හා ගොඩනැගිලි සහිත වහරක කර්මාන්තශාලාව පෞද්ගලික පාර්ශවයක් වෙත බදුදී තිබුණි.

(ඇ) ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සංස්ථාවට අයත් කර්මාන්තශාලා බදුකුලී රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට ලැබිය යුතු වුවත්, වසර 15 කට රු. මිලියන 08 කට එනම් පළමු වසර 05 සඳහා මසකට රු. 28,125 ක් බැගින් එකතුව රු. 1,687,500 ක් ද දෙවන වසර 05 සිට මසකට රු. 42,187 ක් බැගින් එකතුව රු. 2,531,220 ක්ද තෙවන වසර 05 සඳහා රු. 63,281 ක් බැගින් රු. 3,796,860 කට බදු දුන් වහරක කර්මාන්තශාලාවේ බදු කුලිය සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට අයවෙන ලෙස ගිවිසුම්වලට එළඹ තිබුණි.

(ඉ) සංස්ථාවට අයත් ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව හා එම කර්මාන්තශාලාවේ තිබූ වත්කම් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසර 10 කට අධික කාලයක සිට වසා දමා තිබෙන අතර 2015 සැප්තැම්බර් 21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංස්ථාව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත්කර වසර 02 කට වැඩි කාලයක් ගත වී තිබුණද, එම කර්මාන්ත

ශාලාව පිහිටි අක්කර 06 රූඩ් 03 පර්චර්ස් 24.3 ක ඉඩම, අඩි 200 ක් දිග, අඩි 75 ක් පළල ගොඩනැගිල්ල හා නිල නිවාස 03 ක් විගණන වාර්තාවේ දින වන විටත් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඊ) ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාවේ සිදු වූ රු.මිලියන 500 කට ආසන්න රාජ්‍ය මුදල් අවභාවිතාවක් පිළිබඳව අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ ගොනු කර ඇති නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.1 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්**

---

ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව ඉදිකර තිබෙන අක්කර 06 රූඩ් 03 පර්චස් 24.3 ක ඉඩමේ අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව පවතින අතර එම ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 වෙනත් රාජ්‍ය ආයතන වෙත දුන් සංස්ථාවේ සම්පත්**

---

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු දොඩංගොඩ සිල්වඩෙල්හි අක්කර 05 ක ඉඩම එම සභාව වෙත පවරා තිබුනද එම ඉඩම තුළ සංස්ථාව විසින් ඉදිකර ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

---

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) වගන්තිය අනුව සංස්ථාව විසින් 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ සිට 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය දක්වා වසර 07 ක කාල සීමාව සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කර නොතිබුණි.

**4.2 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම**

---

ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලා භූමියේ ඉදිකර තිබෙන ජල ටැංකි සහ ගොඩනැගිලිවල වැහිපීලි සහ හබරල වැනි පඳුරු සහිත වල් බිහිවීම නිසා ඩෙංගු මදුරුවන් බෝවන ස්ථානයක් බවට පත්වී තිබෙන බව වාර්තා වී තිබුණි.